ආකෘතිය (අංක 01)
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290
ආයතනය - තැපැල් දෙපාර්තමේන්තුව

පළමු කොටස :8700

අනු අංක	හඳුනාගෙන ඇති අඩුපාඩුව	අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යයි.
02.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට ඉදිරියේදී නියමිත කාල රාමුව තුල අදාළ කටයුතු සිදු නිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර, ඒ සම්බන්ධයෙන් පුහුණු වීම් හා උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
03.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2021.12.31 දිනට පැවති මාස 6 ඉක්ම වූ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්, හඳුනානොගත් ලැබීම්, හඳුනානොගත් ගෙවීම් හා උපලබ්ධි නොවූ තැන්පතු මේ වන විට නිරවුල් වී ඇත.
04.	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	මේ වන විට නිවැරදිව ප්‍රතිපාදන නියමිත කාලයට වෙන් කර දෙනු ලැබේ.
05.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2021.12.31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ වර්ෂයකට වැඩි මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන්ගෙන් කොටසක් මරණ/විශ්‍රාම පාරිතෝෂිකයෙන් මේ වන විට අයවී ඇති අතර අනෙකුත් නිලධාරීන්ගේ පාරිතෝෂිකයන් සකස් වෙමින් පවතී. වැඩතහනම් හා ධූරය හැරගිය නිලධාරීන්ගෙන් කොටසකගේ ණය ශේෂයන් ණයකරු විසින් වාරික වශයෙන් ගෙවමින් පවතින අතර තවත් කොටසකගේ ඇපකරුවන්ගෙන් වාරික වශයෙන් අයවෙමින් පවතී. ඒ අනුව 2021.12.31 දිනට පැවති වර්ෂයකට වැඩි ණය ශේෂයන්ගේ අයවීම් පහත පරිදිය.
06.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැම්පතු ගිණුමේ 2021 වර්ෂයේ වසර දෙකක් ඉක්මවා තිබූ රු.4,001,595.00 ක් තිබුණත් පහත සඳහන් තැම්පතු පමණක් මෙතෙක් නිරවුල් නොකර පවතී.අනෙකුත් තැන්පතු 2022 වසරේ රජයේ ආදායමට බැර කර නිරවුල් කර ඇත.

		1.කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් ගිණුම ; 16/2 රුපියල් 2794,400 -HNB මුද්දර අවලංගු කිරීමේ ප්‍රසම්පාදනයට අදාල කාර්යය සාධන බැදුම්කරය. 2.ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රදවා ගැනීමේ ගිණුම; 18/9 -1,000,000 සණස ඩිවලොප්මන්ට් බැන්ක් තොග තැපැල් අංක ලබා ගැනීම වෙනුවෙන් කල තැන්පතුවකි.
07.	මු.රෙ. 371හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	මේ වන විට සීමාව ඉක්මවා අතුරු අග්‍රිම නිකුත් කරනු නොලැබේ.
08.	අනුමත සීමාව ඉක්මවා කායී මණ්ඩලය බඳවාගෙන තිබුණි	තැපැල් දෙපාර්තමේන්තුවේ අනුමත නියෝජ්‍ය තැපැල්පති තනතුරු සංඛ්‍යාව 13ක් වන අතර ඉන් 4ක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු මගින් පිරවීම සිදු කෙරේ. ඒ අනුව දෙපාර්තමේන්තුගත තනතුරු 09ක් වේ.දෙපාර්තමේන්තුව තුලින් නියෝජ්‍ය තැපැල්පති වරුනට උසස්වීම් ලබා දෙනු ලබන්නේ විධායක II ශ්‍රේණියේ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව වේ.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි ප්‍රකාරව ශ්‍රේණි උසස්වීම් ක්‍රම වේදය මත නියෝජ්‍ය කැපැල්පති තනතුර සඳහා නිළධාරීන් 02 ක් සුදුසුකම් ලබා තිබුණි.පුරප්පාඩු තනතුරු 02ක් සඳහා ශ්‍රීලංකා පරිපාලන සේවයේ තනතුරු වලට සුදුසුකම් ලත් නිළධාරීන් අයදුම් නොකල බැවින් එම තනතුරු 02 සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් නිලධාරීන් යෙදවීම සිදු කරන ලදී. ඒ අනුව තනතුරු සංඛ්‍යාව 11ක් වී ඇති බව පෙන්වා දෙමි. තැපැල්සේවා නිළධාරී 1 ශ්‍රේණියේ අනුමත කාර්ය මණ්ඩලය 876ක් වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටි අනුව ශ්‍රේණි උසස්වීම් ක්‍රමවේදය මත I ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබන සියලුම නිලධාරීන්ට උසස්වීම් ලබාදීම සිදු කල යුතු බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා උසස් වීම ප්‍රදානය කර ඇත.

දෙවන කොටස : 78

අනු අංක	හඳුනාගෙන ඇති අඩුපාඩුව	අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
01.	ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙළ කිරීම 2023 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර ඇත.මෙහෙයුම් කාර්යාල, ගිණුම් කාර්යාල හා පාලන කාර්යාල ලෙස අංශ 03කට අදාලව විශාල කාර්ය භාරයක් එක් එක් සේවා වාරය මගින් ඉටු කරනු ලැබේ. එම නිසා එකී සියලු අංශ ආවරණය වන පරිදි වෙන වෙනම සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත. ප්‍රායෝගික ගැටළුව වී ඇත්තේ අධික කාර්ය මණ්ඩල හිඟය නිසා සේවාලාභී ප්‍රඥප්තිය සකස් කළ ද නියමිත කාල වේලාව තුළ අදාල කාර්යයන් නිම කිරීම ගැටළු සහගත වීමයි. එය ප්‍රසිද්ධ කර ක්‍රියාත්මක කළ හැකි වන්නේ කාර්ය මණ්ඩල හිඟය සපුරා ගත් පසුය. නැතහොත් සේවාලාභීන්ගේ අතෘප්තියට එය හේතු වනු ඇත.

		කාර්ය මණ්ඩලය සපුරාගෙන මෙය ක්‍රියාත්මක කිරීමෙන් පසු අධීක්ෂණය හා ඇගයීම නිසි ලෙස කළ හැකිය.
02.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	කිසිදු රාජ්‍ය ආයතනයක් මේ වන විට මානව සම්පත් සැලැස්මක් සකසා නැත. එසේ වුවද විධිමත් මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇත.
03.	සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මේ වන විට ගිවිසුම්ගත කිරීම සිදු කර ඇත.
04.	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුනි	ප්‍රතිපාදන සීමා වීම නිසා අත්‍යාවශ්‍ය වැඩසටහන් ප්‍රමාණයක් පමණක් පවත්වනු ලැබේ.
05.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ට මේ විය	තත්වාගණනය කල මතයක් ඉදිරිපත් කර තිබුණි.